(අටවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 16.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2018 ජූනි 22 වැනි සිකුරාදා පූ. භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **රංජිත් අලුවිහාරේ මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියසේන ගමගේ මහතා,** තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලකී ජයවර්ධන මහතා,** කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,** පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික සමගිය හා සහජීවනය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජේ. සී. අලවතුවල මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා,** තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **බුද්ධික පතිරණ මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සෙයියිඩ් අලී සාහීර් මවුලානා මහතා,** ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුත්තු සිවලිංගම් මහතා,** සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරුෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රුෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු හේෂාන් විතානගේ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු ඊ. සරවනපවන් මහතා

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන** : කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

**I**

"කොළඹ ජාතික කලා භවන පරිශ්‍රයේ සේවයේ නියුතු කේ. ඩී. කල්යාන් මහතා විසින් සිදුකර ඇති පැමිණිල්ලක් මත පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) විසින් විමර්ශනයක් සිදුකර ඇති අතර, එම විමර්ශනය සඳහා සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂවරිය සහ ජාතික කලා භවනේ ස්ථානභාර නිලධාරිනිය කැඳවා ඇති නමුත් එම නිලධාරිනියන් වෙනුවෙන් අදාළ ආයතනයේ වෙනත් මාණ්ඩලික නිලධාරින් සහභාගි වී ඇති අතර, පසුව එම විමර්ශනයේ නිර්දේශය සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂවරිය වෙත යොමු කළ විට එම නිර්දේශය අනුව කටයුතු කළ නොහැකි බවටත්, එය ඒකපාර්ශවීය නිර්දේශයක් ලෙසට හැඟී යන බවටත් සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂවරිය විසින් දන්වා ඇති බැවින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) විසින් 1994 අංක 26 දරන පනතින් සංශෝධිත 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනතේ 17 (3) (ඇ) වගන්තිය යටතේ අවධානයට සහ වැඩිදුර කටයුතු සඳහා මා වෙත වාර්තාවක් එවා ඇති බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි."

**II**

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 123 වැනි ස්ථාවර නියෝගයේ විධිවිධාන ප්‍රකාරව කථානායකවරයා සභාපතිවරයා වූ ද, අග්‍රාමාත්‍යවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා සහ මʻවිසින් නම් කරනු ලබන වෙනත් මන්ත්‍රීවරයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාවේ සේවය පිණිස ගරු රවුෆ් හකීම්, ගරු චමල් රාජපක්ෂ සහ ගරු විජිත හේරත් නමැති මන්ත්‍රීවරයන් තිදෙනා මʻවිසින් නම් කරනු ලැබ ඇති බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම** : (1) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම් පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා මහා භාරකාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම :**

(1) ගම්පහ, මුදුන්ගොඩ, අංක 131/14 දරන ස්ථානයෙහි පදිංචි ටෙරන්ස් ප්‍රියන්ත සිරිමාන්න මහතාගෙන් ලැබුණු 2017.09.06 දිනැති පෙත්සම ගරු රුවන් විජයවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

(2) මාතලේ, හත්තොට අමුණ, කළුගහ යන ලිපිනයෙහි පදිංචි එච්. එම්. කේ. හේරත් මහතාගෙන් ලැබුණු 2018.05.19 දිනැති පෙත්සම ගරු රංජිත් අලුවිහාරේ මහතා විසින් පිළිගන්වන ලදී.

(3) කටාන, කෝංගොඩමුල්ල, පිටියමුල්ල පාර, අංක 411/5 දරන ස්ථානයෙහි පදිංචි ආර්. ජී. අජිත් පද්මසිරි මහතාගෙන් ලැබුණු 2018.05.16 දිනැති පෙත්සම ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය විසින් පිළිගන්වන ලදී.

(4) දෙහිවල, හිල් වීදිය, ධම්මාලංකාර මාවත,, අංක 70/2,1/1 දරන ස්ථානයෙහි පදිංචි පී. රාමචන්ද්‍රන් මහත්මියගෙන් ලැබුණු 2018.01.15 දිනැති පෙත්සම ගරු බිමල් රත්නායක මහතා විසින් පිළිගන්වන ලදී.

(5) මහඉලුප්පල්ලම, ගල්මඩුව, අංක 19 දරන ස්ථානයෙහි පදිංචි ජේ.ඒ. තිලක් සමරකෝන් මහතාගෙන් ලැබුණු 2017.11.07 දිනැති පෙත්සම ගරු එස්. සී. මුතුකුමාරණ මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. ශෝක ප්‍රකාශ යෝජනා** : රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, අභාවප්‍රාප්ත ගරු ඒ. ආර්. එම්. අබ්දුල් කාදර් මහතා, ගරු රේණුකා හේරත් මහත්මිය සහ ගරු මල්ලිකා රත්වත්තේ මහත්මිය යන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරන ලදී.

(අ. භා. 1.30 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

(අ. භා. 1.50 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඒ. ආර්. එම්. අබ්දුල් කාදර් මහතා, ගරු රේණුකා හේරත් මහත්මිය සහ ගරු මල්ලිකා රත්වත්තේ මහත්මියගේ අභාවයන් පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනාවන් අනුමත කරමින් ඊට එක් වූ කථානායකවරයා මෙම යෝජනාවන්ට සම්බන්ධ දිනට නියමිත පාර්ලිමේන්තු විවාද නිල වාර්තාවේ (හැන්සාඩ්) පිටපතක් ශෝකයට පත් පවුල්වල අය වෙත යවන ලෙස පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට නියෝග කරන ලදී.

**5. කල් තැබීම (වන සතුන්ගෙන් සිදුවන වගා හානිය) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි, ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය යුතුය"යි ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.24 ට ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 4.35 ට, 2018 ජූලි 03 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.